ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2019/07/22 |

## උද්ධමනය 2019 ජූනි මාසයේ දී පහළ යන ලදී

ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2013=100)[1] ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, පෙර වසරේ අනුරූප මාසයේ පැවති ඉහළ පදනම් අගය හේතුවෙන්, 2019 මැයි මාසයේ පැවති සියයට 3.5 හි සිට 2019 ජූනි මාසයේ දී සියයට 2.1 දක්වා පහළ ගියේය. මේ අතර, 2019 ජූනි මාසයේ දී, ආහාර සහ ආහාර නොවන යන කාණ්ඩ දෙකෙහිම ලක්ෂ්‍යමය උද්ධමන අගයන් පිළිවෙලින් සියයට -0.4 හි සහ සියයට 6.7 හි සිට සියයට -2.9 සහ සියයට 6.2 දක්වා පහළ යන ලදී.

**මතුපිට උද්ධමනය**

ලක්ෂ්‍යමය උද්ධමනය : 2.1%

වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 2.0%

මාසික වෙනස : 0.4%

**මූලික උද්ධමනය**

ලක්ෂ්‍යමය උද්ධමනය : 6.1%

වාර්ෂික සාමාන්‍ය උද්ධමනය : 4.4%

මාසික වෙනස : 0.0%

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජා.පා.මි දර්ශකයෙහි වෙනස, 2019 ජූනි මාසයේ දී සියයට 2.0 හි නොවෙනස්ව පැවතුණි.




මාසික වෙනස් වීම සලකා බැලීමේදී, ආහාර සහ ආහාර නොවන යන කාණ්ඩ දෙකෙහිම අයිතමයන්හි මිලගණන්වල දක්නට ලැබුණු

[1] ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබයි.

ඉහළ යෑම් හේතුවෙන්, 2019 ජූනි මාසයේදී ජා.පා.මි.ද. සියයට 0.4 කින් ඉහළ ගියේය. ආහාර කාණ්ඩයෙහි මාළු, ලොකු ළූණු, අමු මිරිස්, රතු ළූණු සහ සහල් මිලගණන්වල ඉහළ යෑම් වාර්තා විය. මීට අමතරව, ආහාර නොවන කාණ්ඩයෙහි ප්‍රවාහන; සහ ආපනශාලා සහ හෝටල් උපකාණ්ඩයන්හි අයිතමවල මිලගණන් ද මෙම මාසය තුළ දී ඉහළ ගියේය.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය නිරූපණය කරන මූලික උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත 2019 මැයි මාසයේ පැවති සියයට 6.3 හි සිට 2019 ජූනි මාසයේ දී සියයට 6.1 දක්වා පහළ ගියේය. වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2019 මැයි මාසයේ පැවති සියයට 4.0 හි සිට 2019 ජූනි මාසයේ දී සියයට 4.4 දක්වා ඉහළ ගියේය.

## ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම

**පදනම : 2013 = 100**

| වසර | මාසය | දර්ශක අගය | | මාසික % වෙනස | | ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) | ජා.පා.මි.ද. | ජා.පා.මි.ද. (මූලික) |
| 2017 | මැයි | 121.8 | 123.0 | 0.7 | 0.4 | 7.1 | 4.7 | 6.1 | 6.4 |
| | ජූනි | 123.4 | 123.1 | 1.3 | 0.1 | 6.3 | 4.1 | 6.1 | 6.1 |
| | ජූලි | 122.4 | 122.9 | -0.8 | -0.2 | 6.3 | 4.2 | 6.2 | 5.9 |
| | අගෝස්තු | 122.3 | 123.0 | -0.1 | 0.1 | 7.9 | 4.8 | 6.5 | 5.8 |
| | සැප්තැම්බර් | 123.3 | 123.1 | 0.8 | 0.1 | 8.6 | 4.6 | 6.8 | 5.7 |
| | ඔක්තෝබර් | 124.8 | 123.1 | 1.2 | 0.0 | 8.8 | 4.1 | 7.1 | 5.6 |
| | නොවැම්බර් | 126.4 | 123.8 | 1.3 | 0.6 | 8.4 | 2.8 | 7.5 | 5.2 |
| | දෙසැම්බර් | 126.6 | 123.8 | 0.2 | 0.0 | 7.3 | 2.7 | 7.7 | 4.9 |
| 2018 | ජනවාරි | 125.8 | 123.9 | -0.6 | 0.1 | 5.4 | 2.1 | 7.6 | 4.5 |
| | පෙබරවාරි | 123.7 | 124.4 | -1.7 | 0.4 | 3.2 | 2.0 | 7.2 | 4.1 |
| | මාර්තු | 122.8 | 124.6 | -0.7 | 0.2 | 2.8 | 1.9 | 6.7 | 3.6 |
| | අප්‍රේල් | 122.9 | 124.8 | 0.1 | 0.2 | 1.6 | 1.9 | 6.1 | 3.3 |
| | මැයි | 124.3 | 125.1 | 1.1 | 0.2 | 2.1 | 1.7 | 5.7 | 3.1 |
| | ජූනි | 126.5 | 125.3 | 1.8 | 0.2 | 2.5 | 1.8 | 5.3 | 2.9 |
| | ජූලි | 126.6 | 125.7 | 0.1 | 0.3 | 3.4 | 2.3 | 5.1 | 2.7 |
| | අගෝස්තු | 125.4 | 126.3 | -0.9 | 0.5 | 2.5 | 2.7 | 4.7 | 2.5 |
| | සැප්තැම්බර් | 124.4 | 126.9 | -0.8 | 0.5 | 0.9 | 3.1 | 4.0 | 2.4 |
| | ඔක්තෝබර් | 124.9 | 127.3 | 0.4 | 0.3 | 0.1 | 3.4 | 3.3 | 2.4 |
| | නොවැම්බර් | 127.7 | 127.6 | 2.2 | 0.2 | 1.0 | 3.1 | 2.7 | 2.4 |
| | දෙසැම්බර් | 127.1 | 127.6 | -0.5 | 0.0 | 0.4 | 3.1 | 2.1 | 2.4 |
| 2019 | ජනවාරි | 127.3 | 130.2 | 0.2 | 2.0 | 1.2 | 5.1 | 1.8 | 2.7 |
| | පෙබරවාරි | 126.7 | 131.3 | -0.5 | 0.8 | 2.4 | 5.5 | 1.7 | 3.0 |
| | මාර්තු | 126.4 | 131.8 | -0.2 | 0.4 | 2.9 | 5.8 | 1.7 | 3.3 |
| | අප්‍රේල් | 127.3 | 132.6 | 0.7 | 0.6 | 3.6 | 6.3 | 1.9 | 3.7 |
| | මැයි | 128.7 | 133.0 | 1.1 | 0.3 | 3.5 | 6.3 | 2.0 | 4.0 |
| | ජූනි | 129.2 | 133.0 | 0.4 | 0.0 | 2.1 | 6.1 | 2.0 | 4.4 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව